මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.),
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.

චක්‍රලේඛ අංක : 02/2015

2015-01- 21

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල,
ස.ණ.ස. සමිති සහ ස.ණ.ස. සංගම්වල ගරු සභාපතිවරුන් වෙත ,

**<u>සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා ගෙවීම.</u>**

සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා අනුමත කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2007.01.16 දිනැති 7/99 (1 ) සහ 2007.03.08 දිනැති 7/2007 චක්‍රලේඛවලින් නියම කර ඇති දීමනාවන් වර්තමානයට ගැළපෙන අයුරින් යාවත්කාලීන නොවීම හේතුවෙන්, සමුපකාර සමිති සහ සමුපකාර සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් වශයෙන් කටයුතු කරනා නිලධාරීන් පත්වන අපහසුතාවයන් සැලකිල්ලට ගෙන පහත සඳහන් පරිදි දීමනාවන් යාවත්කාලීන කර ඇත.

02. ඒ අනුව, 2014-12-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල රාජකාරී ඉටු කරනු ලබන එක් එක් සාමාජිකයා වෙනුවෙන්, පහත සඳහන් සීමාවන්ට යටත්ව ගෙවීම් කිරීම කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව, කොමිෂන් සභා නියමය පරිදි දන්වා සිටිමි.

i. දෛනික සහභාගීත්ව දීමනාව - රු.1,000/-

ii. අධීක්ෂණ මට්ටමෙන් ඉහළ තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් - රු.50/- බැගින්

iii. අධීක්ෂණ මට්ටමෙන් පහළ තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඇති එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් - රු.35/- බැගින්

iv. උපරිම දෛනික දීමනාව - රු.2,500/-

03. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සංයුතිය සහ එම සාමාජිකයින් පත් කිරීම සම්බන්ධයෙන් දැනට පවත්නා විධිවිධානයන්ගේ කිසිදු වෙනසක් සිදු නොවන බව ද, කොමිෂන් සභා නියමය පරිදි වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩබ්. පී. එම්. ජී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 01. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය -.අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.